# ප්‍රවෘත්ති නිවේදනය

**ප්‍රධාන ගෘහ ඒකක සමීක්ෂණ හතරක ක්ෂේත්‍ර රාජකාරි ආරම්භය කිරීම**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

**NR/9/2016/1 ටෙලි : 011-2877959 ෆැක්ස් : 011-2147447 2016,ජනවාරි 21**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 වර්ෂයේදී ගෘහ ඒකක සමීක්ෂණ හතරක් පැවැත්වීමට කටයුතු කර ඇත. ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයෙහි හා ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණයෙහි හා ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණයෙහි කේෂත්‍ර කටයුතු මේ වනවිටත් ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණයෙහි කේෂත්‍ර කටයුතු 2016 ජුනි මස ආරම්භ කිරීමට බලාපෙරොත්තුවේ.

ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය 1990 වර්ෂයේ සිට කාර්තුමය වශයෙන් පවත්වනු ලබයි. ශ්‍රී ලංකාවේ ශ්‍රමබලකාය, රැකියා නියුක්තිය හා රැකියා වියුක්තිය ආදි වැදගත් සංඛ්‍යාති මෙම සමීක්ෂණයේ දත්ත මගින් සම්පාදනය කරනු ලබයි.

ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය පවත්වනු ලබන්නේ ඒක පුද්ගල ආදායම, ඒක පුද්ගල වියදම, දරිද්‍රතාවය සහ වත්කම්වල හිමිකම යනාදි සංඛ්‍යාති ගණනය කිරීම සඳහායි. ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය සෑම වර්ෂ තුනකටම වරක් පවත්වනු ලබන අතර අවසන් වරට පවත්වනු ලැබුවේ 2012/13 වර්ෂවලදිය.

වයස අවුරුදු 5 සිට 17 දක්වා ළමා ජනගහනයේ ක්‍රියාකාරකම් පිළිබඳව තොරතුරු ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය මගින් ආවරණය කරනු ලබයි. දෙපාර්තමේන්තුව මගින් මෙම සමීක්ෂණය 1999 සහ 2008/09 වර්ෂවලදී ද පවත්වනු ලැබිය. 2016 වර්ෂයේදි මෙම සමීක්ෂණය පවත්වනු ලබන්නේ තෙවන වරටය. ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලබන්නේ කම්කරු සබඳතා අමාත්‍යාංශය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) සහයෝගිත්වයෙනි.

ශ්‍රී ලංකාවේ නිවාස ඒකක සංඛ්‍යාව මිලයන 5.2 ක් පමණ වේ. මෙම සමීක්ෂණ සඳහා දත්ත එක් රැස් කරනු ලබන්නේ මුළු රටම ආවරණය වන පරිදි තක්ෂණික ක්‍රමවේද මගින් තෝරාගත් නිවාස ඒකක 25,000 ක නියැදියක් මගිනි. ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය සහ ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය යන සමීක්ෂණ දෙකම සඳහා එකම නියැදියක් තෝරා ගනු ලබන අතර, ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය සහ ශ්‍රී ලංකා ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය සඳහා වෙන වෙනම නියැදීන් තෝරා ගනු ලබයි.

මනා පුහුණුවලත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙහි නිලධාරින් විසින් මෙම සමීක්ෂණ සඳහා මෙම දිනවල තෝරගත් නිවාස ඒකක වලින් දත්ත එක් රැස් කරනු ලබයි. රටට අවශ්‍ය සහ වැදගත් සංඛ්‍යාති සම්පාදනය සඳහා පමණක්ම මෙලෙස එක් රැස් කරනු ලබන දත්ත යොදා ගනු ලබන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා ප්‍රකාශ කර සිටි. සපයනු ලබන තොරතුරුවල රහස්‍යභාවය සුරකිනු ලබන අතර මෙම සමීක්ෂණ සාර්ථක කර ගැනිම සඳහා නිවැරදි තොරතුරු ලබා දෙන ලෙස තෝරාගත් ගෘහ ඒකක වල ගෘහ මූලිකයන්ගෙන් දෙපාර්තමේන්තුව ඉල්ලා සිටි.

ළමා ක්‍රියාකාරම් සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු 2016 ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා ක්‍රියාත්මක කරනු ලබන අතර, ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය සහ ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය 2016 වර්ෂය පුරාම ක්‍රියාත්මක කරනු ලබයි. ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණයෙහි හා ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණයෙහි කේෂත්‍ර කටයුතු සඳහා ගණන් ගන්නා නිලධාරින් අවම වශයෙන් එක් වරක් ගෘහ ඒකකයට පැමිණෙන අතර, ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය සඳහා අවම වශයෙන් තෙවරක් පැමිණෙනු ඇත.

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**